**කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම - 2021/2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව ,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 2.36 ඡේදයට පටහැනිව සමාගමේ 2018 වර්ෂයේ සිට 2021 මාර්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ ස්ථාවර තැන්පතු පොලී රු.1,939,610 ක් මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී පොලී ආදායම් උපචිත පදනමට ගෙන පිළියෙල කිරීමට කළමනාකරණය කටයුතු කරනු ඇත. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව උපචිත පදනම මත ආදායම ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.3,883,025 ක් වූ පූර්ව කාලපරිච්ඡේද ගැළපුම් වලට අදාළව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 10.23 ඡේදයේ (a) සිට (d) දක්වා වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉකුත් වර්ෂයේ විගණනයෙන් දක්වා තිබුණු ගිණුම්කරණ දෝෂ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිත 10.21 ට අනුව නිවැරදි කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 79(ඇ) ඡේදය ප්‍රකාරව දැනට භාවිතා නොකරන රු.23,210,000 ක් වූ යන්ත්‍රෝපකරණ පිළිබඳව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි. | අදාළ උපකරණ කොලොන්ගහ වැඩබිමේ පවතින දැනට භාවිතා නොකරන පෞරාණික වටිනාකමක් ඇති යන්ත්‍ර වන අතර මේවා ආරම්භ කිරීමට අපේක්ෂිත "මිනිරන් කටුගෙය" හි ප්‍රදර්ශනය කිරීමට යොදා ගැනීමට අපේක්ෂිතය. එම යන්ත්‍ර සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 17.16 පරිදි අපේක්ෂිත ආර්ථික වටිනාකමක් හෝ ආයුකාලයක් නිර්ණය කළ නොහැකි වන අතර LKAS 16 දේපළ හා පිරියත ගනයෙහි ලා ක්ෂය ප්‍රතිපාදනය කළ නොහැකිය. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විකුණුම්වලට අදාළ රාජ්‍යභාග ගැනුම්කරුගෙන් අයකර ගැනීම සමාගම විසින් දිගින් දිගටම සිදුකර තිබුණද ඒ පිළිබඳව වූ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ගනුදෙනුකරුවන් වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ගෙවන ලද රු.827,410 ක රාජ්‍යභාගය ලැබිය යුතු දැ ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | මෙම ගෙවීම 2022/23 අප්‍රේල් මාසයේදී ගිණුම්ගත කර ඇති අතර 2022 අප්‍රේල් 18 එම මුදල ගැනුම්කරු විසින් ප්‍රතිපූර්ණය කර ඇත. | විකුණුම්වලට අදාළ රාජ්‍යභාගය අයකර ගැනීමේ හා ගෙවීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර ලැබිය යුතු රාජ්‍යභාගය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තොගයේ වෙනස්වීම රු.127,734 කින් අඩුවෙන් ද පොලී ගෙවීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කළමනාකරණය තීරණය කර ඇත. | මුදල් ගලා යාම් හා ඊම් නිවැරදිව දැක්වෙන පරිදි ආකෘතිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගමේ 2021/2022 ගිණුම් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2023 අප්‍රේල් 03 දිනදීය. | 2020/21 වර්ෂයේ විගණන කටයුතු අවසන් කර එම ශේෂයෙන් 2021/22 ගිණුම් වලට ගෙන ගිණුම් සකස් කළ යුතුව පැවති නිසා මෙම කටයුත්ත ප්‍රමාද විය . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය වාර්තා හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය | සමාගම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | සමාගමට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී ඇති නමුත් පවතින මූල්‍ය දුෂ්කරතාවයන් නිසා අභ්‍යන්තර විගණකවරයෙකු ක්‍රියාකාරි පදනමින් (Acting basis) කර්මාන්ත අමාත්‍යංශයෙන් වරින් වර ලබාදීමට කටයුතු කර ඇත. | අභ්‍යන්තර විගණක වරයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,085,760 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.11,477,201 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.391,441 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පොලී ආදායම රු.2,734,776 කින් වැඩිවී සෘජු පිරිවැය රු.2,233,726 කින් අඩු වුවද විකුණුම් ආදායම රු.2,714,446 කින් අඩුවීම හා ආයතන හා පරිපාලන වියදම හා නඩත්තු වියදම පිළිවෙලින් රු.1,645,717 කින් හා රු.203,045 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කහටගහ පතලට අයත් අක්කර 26.5 ක් සහ අක්කර 6 ක ඉඩම් කොටස් දෙකක් සම්බන්ධයෙන් අයිතිවාසිකම් ඉදිරිපත් කරමින් බාහිර පුද්ගලයින් විසින් පිළිවෙලින් 2004 සහ 2007 වර්ෂ වලදී සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි. එසේ වුවද එම නඩු කටයුතු විගණිත දිනය වූ 2023 මැයි 31 දින වන විටත් නිරවුල් වී නොතිබුණි. | දැනට මෙම නඩු කටයුතු අධිකරණමය කරුණක්ව පවතින බැවින් ආයතනයට මැදිහත්වීමට නොහැකි මට්ටමක පවතී. | සමාගම සතු දේපළ නිරවුල් කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | පතලේ සේවය කළ පුද්ගලයින් තිදෙනෙකුද ඇතුළුව 11 දෙනෙකු පතල් භූමිය තුළ පිහිටි රූඩ් 8 යි පර්චස් 87 ක ප්‍රදේශයක් තුළ පිහිටි නිල නිවාසවල අනවසරයෙන් පදිංචි වී සිටින අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කර ඇතත් 2023 මැයි 31 වන විටද නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට හා බලහත්කාරකමින් ඉඩම් දේපළ අත්පත් කර ගැනීම වැළැක්වීමට පාලනාධිකාරය උත්සහකර ඇති නමුත් තවම සම්පූර්ණයෙන්ම එම කටයුතු නැවතී නොමැත. | සමාගම සතු දේපළ නිරවුල් කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2003 ඔක්තෝබර් 15 දිනැති ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියට අනුව දොඩම්ගස්ලන්ද යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් අවශ්‍යය ඉඩ පහසුකම් කහටගහ පතලට අයත් ඉඩම්වලින් ලබා දීමට 2003 ඔක්තෝබර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයක් සඳහා ඉඩම නිදහස් කර තිබුණද විගණිත දිනය වන විට එම කාලය වසර 18 ක් ඉක්මගොස් ඇතත් බදුකුලී ගිවිසුමකට එළඹීමෙන් හෝ බදුකුලී ගෙවීමෙන් තොරව පුහුණු මධ්‍යස්ථානය සඳහා ඉඩම පාවිච්චි කරනු ලබයි. | මෙම ඉඩමට පවතින නඩු කටයුත්ත නිසා මෙම කටයුත්ත ප්‍රමාද වී ඇත. | බදු කුලී ගිවිසුමකට එළඹීම සඳහා අදාළ පාර්ශව සමඟ එකඟතාවයකට පැමිණීමටත්, ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමටත්, හිඟ බදු කුලී අයකර ගැනිමටත් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පතලේ පළමු අඩි 1130 මට්ටමේ සිට අඩි 2000 මට්ටම දක්වා පිවිසුමට දෙවන පතල් වළ (2nd shaft) ක අවශ්‍යතාව වසර කිහිපයකට පෙර හඳුනාගෙන මූලික කටයුතු ආරම්භ කර ඇතත් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | දෙවන පතල් වල ආරම්භ කිරීම කොරෝනා තත්ත්වය නිසා කල් තබන ලද අතර පුපුරණ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් එම කටයුතු දුෂ්කර වී ඇත. 2023 වර්ෂයේදී එම කටයුත්ත ආරම්භ කිරීමට සැලසුම්කර ඇත. | සැලසුම් ප්‍රකාරව මෙහෙයුම් කටයුතු පුළුල් කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | අයකරගත යුතු එකතු කළ අගය මත බදු වශයෙන් ගිණුම්වල දක්වා තිබුණු රු.6,207,281 ක වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු එකතුකළ අගය මත බදු වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විගණන කටයුතු කර නිදහස් කරන තෙක් නිදහස් කර ගැනීමට හෝ හිලව් කර ගැනීමට නොහැකිව පවතී. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ එකඟතාවයට පැමිණ මෙම වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් මිනිරන් කැණීම් කර මාසික නිෂ්පාදිතය මෙට්‍රික් ටොන් 90 දක්වා වර්ධනය කර ගැනීමට සමාගම සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 29 ක් වූ අතර මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 342.35 ක් විය. ඒ අනුව මෙට්‍රික් ටොන් 599.30 ක් වූ ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 256.95 කින් අඩුවී තිබුණි. | 2021 වර්ෂයේ පැවති අධික වර්ෂාපතනය නිසා මිනිරන් වලවල් ජල ගැලීම් වලට ලක්ව, වසා දැමීම නිසාද රට තුළ පැවති කොරෝනා ව්‍යසන තත්ත්වය නිසාද වැඩවර්ජන හා සේවක නොසන්සුන් තත්ත්වයන් නිසාද රට තුළ පැවති ඉන්ධන හා විදුලි බල අර්බුදය නිසාද සේවක පැමිණීම, වැඩකළ හැකි කාලය සීමාවීම මතද අපේක්ෂිත නිෂ්පාදන මට්ටමට ළඟාවීමට නොහැකි විය. | ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන සැලසුම් කළ යුතු අතර සැලසුම් ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමටද කටයුතු කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව අමුද්‍රව්‍ය ස්වරූපයේ මිනිරන් මෙට්‍රික් ටොන් 680 ක් පෙරසැරිකර අපනයනය කිරීම මගින් රු.මිලියන 219.7 ක ආදායමක් ඉපැයීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මිනිරන් මෙට්‍රික් ටොන් 384.81 ක් දේශීය හා විදේශීය වශයෙන් අලෙවි කර රු.මිලියන 123.4 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | පවතින තොගය පෙරසැරි කර ඉහළ කාබන් මට්ටම් වලට උසස් කළ අතර ආරම්භයේදී මිනිරන් මෙට්‍රික් ටොන්. 10 ක් පෙරසැරි කර ඇත. විවිධ උත්සාහයන් දැරුවද නව නිෂ්පාදනය (KP 97/99) සඳහා වෙළඳපළක් සොයාගැනීමට නොහැකි වී ඇත. | ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන සැලසුම් කළ යුතු අතර සැලසුම් ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමටද කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලෝකයේ ස්වාභාවික ස්ඵටික ධමනි මිනිරන් සඳහා වූ අද්විතීය සැපයුම්කරු වීම සමාගමේ දැක්ම වුවද සමාගම තම ගැනුම්කරුවන් තෝරා ගැනීමට ජාත්‍යන්තර ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණු අතර දිගින් දිගටම විදේශීය ගැනුම්කරුවන් දෙදෙනෙකුට සමාගමේ මුළු නිෂ්පාදනය අපනයන කරමින් පැවතුණි. ඒ | දැනට මේ සඳහා ටෙන්ඩර් කැඳවීමට අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව කටයුතු කරගෙන යන අතර මීට පෙරද දෙවතාවක් ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවා ආයතනය සතුව පවතින මිනිරන් තොග ඉවත් කිරීමට උත්සහ කළද අමුද්‍රව්‍ය ස්වභාවයේ | සමාගමේ දැක්ම අනුව අරමුණු ස්ථාපිත කරගෙන ඒවා ඉටුකර ගැනීමට සැලසුම් සහගතව අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් සමාගමේ දැක්ම අනුව කාර්ය මෙහෙයවීමක් නොවූ අතර විදේශීය ගැනුම්කරුවන් අතර තරඟකාරීත්වයක් ඇතිකර මිනිරන් සඳහා ඉහළ මිලක් ලබාගැනීමට හා නව වෙළඳපොළ සොයා ගැනීමටද නොහැකිව තිබුණි. මෙහිදී, සමාලෝචිත වර්ෂයේ අලෙවි ප්‍රවර්ධනය සඳහා සැලසුම් කළ වෙළඳපොළ ප්‍රචාරණය , තානාපති කාර්යාල වල සහය ලබා ගැනීම, ජාත්‍යන්තර ප්‍රභව වලින් ලෝක මිල ගණන් ලබා ගැනීම යනාදී කාර්යභාරයයන් ක්‍රියාත්මක කරද නොතිබුණි. | පවතින මෙම මිනිරන් මිලදී ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. | |
| (ඇ) | මිනිරන් ඛනිජය සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලින් සිදුකිරීම අරමුණු කර ගෙන සමාගමේ විද්‍යාගාරය ස්ථාපිත කර තිබුණද ඊට අදාළ කාර්යයන් කිසිවක් එහි සිදුකර නොතිබුණු අතර අපනයනය සඳහා සකස් කරන ලද මිනිරන් සාම්පල තුළ අන්තර්ගත කාබන් ප්‍රතිශතය මිනුම් කිරීම පමණක් එහිදී සිදුකර තිබුණි. සමාගම වර්තමානය වන විට පියලි (Flake- 97%-99%) සහ චිප්ස් (Chips-90%-92%C) යන ආකාර වලින් පමණක් මිනිරන් අපනයනය කර තිබුණු අතර අගය එකතු කර නිමි හෝ අර්ධනිමි වශයෙන් නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි. | විද්‍යාගාරය තුළ විවිධ මිනිරන් අගය එකතු කිරීමේ කටයුතු සම්බන්ධව පර්යේෂණ කටයුතු සිදුකර ඇති අතර මූල්‍ය දුෂ්කරතා නිසා එම කටයුතු අතපසු වෙමින් පවතී. | මිනිරන් සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | තොගයෙන් වැඩි ප්‍රමාණයක් එනම්, සියයට 57 ක් පමණ අඩු කාබන් ප්‍රතිශතයකින් යුත් මිනිරන් වලින් සමන්විත වී තිබුණු අතර Flotation යන්ත්‍රයක් මිලදීගෙන, එය ආධාරයෙන් අඩු කාබන් සහිත මිනිරන්වල කාබන් ප්‍රතිශතය ඉහළ නංවා ආදායම වැඩිකර ගැනීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂා කර තිබුණද මුදල් නොලැබීම හේතුවෙන් 2023 ජුනි 30 වන විටද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | Flotation යන්ත්‍රය ස්ථාපනය කිරීමට මහා භාණ්ඩාගරයෙන් රු.මිලියන 20 ක ප්‍රදානයක් දැනට අනුමත වී ඇති අතර මෙම යන්ත්‍රය මිලදී ගැනීමේ හා ස්ථාපනය කිරීමේ කටයුතු මේ දිනවල සිදු වෙමින් පවතී. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා සැලසුම් සකස් කළ යුතු අතර සැලසුම් ප්‍රකාරව මෙහෙයුම් ප්‍රවර්ධනය සඳහා කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2006 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණු සමාගමේ ජීප් රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර සමාගම් භූමියේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි. | මෙම ජීප් රථය අලුත් වැඩියා කර ආයතනයේ පරිහරනයට ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | රථය අලුත්වැඩියා කර පරිහරණය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාගමේ පොල් වගාවේ ආදායම වූ රු.1,609,395 වෙනම ආදායම් මූලාශ්‍රයක් ලෙස හඳුනාගැනීම වෙනුවට විවිධ ආදායම් ලෙස දක්වා තිබුණි. ඊට අදාළ වියදම රු.2,587,823 ක් වීමෙන් ඒ තුළින් වූ ශුද්ධ අලාභය රු.978,428 ක් විය. | සමාගමට අයත් අක්කර 102 පමණ වන භූමියේ පතල පවත්වාගෙන යාමේදී සුද්ධ පවිත්‍ර කර පවත්වාගෙන යෑම අනිවාර්ය වන අතර එහි කොටසක ඇති පොල් වගාව මගින් ජනනය වන ආදායම පතල් ව්‍යාපාරයේම වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමට අතීතයේ සිටම කළමනාකරණය කටයුතු කර තිබුණි. | ආදායම් ලැබෙන ප්‍රමාණාත්මක මූලාශ්‍ර වෙනම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය අනුව, සමාගම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත යුතු 79 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර කාර්ය මණ්ඩලය 42 ක්ද කොන්ත්‍රාත් පදනම මත 74 ක්ද, වැඩබැලීමේ පදනම මත එක් නිලධාරියෙක් හා අනියම් කම්කරුවන් 09 ක්ද, ඇතුළුව කාර්ය මණ්ඩලය 126 දෙනෙකු විය. | ආයතනයට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. දැනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 5 ක් සඳහා අනුමැතිය දී ඇති අතර ඉන් කොටසක් සඳහා අයදුම්පත් කැඳවා ඇත. පතලේ කටයුතු පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය මත සේවකයින් බඳවා ගැනීමට කළමනාකරණය විටින් විට කටයුතු කර තිබුණි. | කාර්යමණ්ඩලය අනුමත කරගෙන ඒ අනුව සේවකයින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |